# ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ "කාර්මික නිලධාරී" තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ

**වැටුප් කාණ්ඩය** : MA 2-3 (කළමනාකරණ සහකාර - තාක්ෂණික)
(පුරප්පාඩු සංඛ්‍යාව - 17)

**අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සම්මාන 04 ක් සහිතව විෂයයන් 06 කින් සමත්වීම හා අ.පො.ස. (උසස් පෙළ) විභාගය විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම

සහ

තනතුරේ කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නියම කර ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (5) මට්ටමට අදාළ පාඨමාලාවක් හෝ ඉලෙක්ට්‍රොනික් / විදුලි සංදේශ / විදුලි ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික ඩිප්ලෝමාවක් (NDT / HNDE / NDES / OUSL) හෝ C & G Advanced Diploma සමත්ව තිබීම.

**වයස** : අවුරුදු 18 ත් 35 ත් අතර විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ)

**වැටුප් පරිමාණය** : MA 2-3, 2025 රු. 52,700 - 800 x 10 - 1,190 x 11- 1,320 x 10 - 1,350 x 10 - 100,490/-
(මෙම වැටුප් පරිමාණය සම්පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වනුයේ 2027.01.01 දින සිට වන අතර, එතෙක් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ)

**සෙසු දීමනා** : ජීවන වියදම් දීමනාව රු. 17,800/- ක් සහ සංස්ථාව විසින් කලින් කලට තීරණය කරනු ලබන සෙසු දීමනා, නිලධාරියා සහ පවුලේ සාමාජිකයින් සඳහා වෛද්‍ය රක්ෂණ ආවරණය.

**පොදු :**

මෙම තනතුර සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාර අරමුදල් හිමිකම් සහිත ස්ථිර තනතුරකි. අයදුම්කරුවන් යහපත් සෞඛ්‍ය තත්ත්වයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය. සුදුසුකම් සහිත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් මගින් පුහුණුවන කාර්මික සහකාර තනතුරට බඳවාගනු ලැබේ. පුහුණු කාලය මාස 06 ක් වන අතර, පුහුණු කාලයේ කාර්ය සාධනය පදනම් කරගෙන පුහුණුව අවසන් වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්මික නිලධාරී තනතුරට පත් කරනු ලැබේ. තෝරාගන්නා අයදුම්කරුවන් පුහුණුවෙන් පසු වසර 05 ක කාලයක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවය කරන බවට එකගව මූල්‍ය බැඳුම්කරයකට පුහුණුව ආරම්භ කරන අවස්ථාවේදී අත්සන් තැබිය යුතුය. රජයේ දෙපාර්තමේන්තු හෝ සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය ආයතන ප්‍රධානී මගින් ඉදිරිපත් කළ යුතුය.

**සැලකිය යුතුයි :** සම්මුඛ පරීක්ෂණය ව්‍යුහගත පරීක්ෂණයක් වන අතර, එහිදී ලබාගන්නා ලකුණු අනුව සකස් කරන ලද ලේඛනයක කුසලතා අනුපිළිවෙල අනුව අදාළ පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

අයදුම්පත් 2026.08.17 දිනට පෙර තනතුරේ නම සඳහන් කර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ jobs@rupavahini.lk යන විද්‍යුත් ලිපිනයට හෝ එවන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව,**
**නිදහස් චතුරශ්‍රය, කොළඹ 07.**
**දුරකථන අංකය : 011-2698187**
**වෙබ් අඩවිය : www.rupavahini.lk**